# කෘෂිකම් නැණකුසුම - සියවස සමරයි

දළදා හිමි වැඩ සිටින
වැව් සිසිල නැහැවෙන
ලෝ උරුම නගරයෙකි
සෙංකඩගත පුරේ

හන්තාන පාමුල
පේරාදෙණිය නගර මැද
"කෘෂිකම් නැණකුසුම"
පිපී පිබිදී දිලේ

ව්‍යාප්ති පර්යේෂණ
ගොවිපල් අංශයන්
ගොවිබිමට අරණැළු
යස ඉසුරු දෙයි සැනේ

ගොවිපල් බීජ ගැන
අස්වනු පිළිබඳව
උගත් වියතුන් සැම
දෙයි සැමට නැණ ගුනේ

විවිධ වී පලතුරු
අල බෝග එළවළු
රනිල හා ධාන්‍යයත්
ගොවිබිමට පුදමිනේ

ගොවිදනගේ ජයපතා
නිසි ඔවා ලැබ දෙමින්
ගොවිබිම පුබුදුකල
මව්පියන් මෙනි අපේ

බෝග වල ගැටළු
විවිධ කෘෂි තොරතුරු
දහනමයයි විස්සෙන්
ප්‍රචාරය වෙයි සැනේ

සරු පොළොව පළ ලබන
නිසරු පස සරු කරන
ප්‍රභේද ජනිත කල
රජ කෙනෙකි ගොවිබිමේ

ජංගම ගොවි සතිය
වැඩමුළු පුහුණු සැසි
ගමීඋදා ප්‍රදර්ශන
දැයට කිරුළක් වුනේ

කෙත්වතු උයන් වල
තුරු වියන් වැල් ගොමුවල
සරු අස්වනු වලින්
දැයේ අටු කොටු පිරේ

ඉසුරුමත් හෙට දවස
අසිරිමත් කරන්නට
ඔබ දැක්ම මෙහෙවර
මුතු මැණික් කැට වගේ

වසර සිය සැමරුවත්
නැන ගත සිත දුබල
ගොවිසිත් පහන් කළ
සිප්හලකි මව්බිමේ

දෙදහස් දොළහදී
සිය වසරක් සපිරි
උපන් දින සැමරුමට
දැයේ තුති මල් පිදේ

විවිධ තුරුලතා මැද
පොපියනා නැණ කුසුම
කල්පයක් දිනේවා
දිගාසිරි පතමි මම

*අයි.කේ. රත්නායක*
*කෘෂිකර්ම උපදේශක*
*ව්‍යාප්ති හා පුහුණු අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව*
*පේරාදෙණිය*